සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

33 S I

11 ශ්‍රේණිය

# ඉතිහාසය - I

කාලය පැය 01 යි

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි ඃ
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති (1), (2), (3) සහ (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දි ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

01. ඉතිහාසය හැදෑරීමේදී වැදගත් මූලාශ්‍රයක් වන සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනයේ දී සැලකිලිමත් විය යුතු වැදගත් කරුණක් වන්නේ මින් කුමක් ද?
   (1) මූලාශ්‍රයේ ප්‍රමාණය
   (2) මූලාශ්‍රය රචනා වූ විලාශය
   (3) මූලාශ්‍රයේ කතුවරයා
   (4) කතුවරයාගේ ජීවන මට්ටම

02. ශ්‍රී ලංකාවට පැමිණ මෙහි ඇති තතු දැකබලා රචනා කරන ලද ග්‍රන්ථය කුමක් ද?
   (1) ඔනෙසික්‍රිටස්ගේ වාර්තා
   (2) රිබෙයිරෝගේ ලංකාව පිළිබඳ ග්‍රන්ථය
   (3) ෆර්නාඕ ඩී ක්වේරොස්ගේ ලංකාව පිළිබඳ ග්‍රන්ථය
   (4) නැචුරලිස් හිස්ටෝරියා කෘතිය

03. ක්‍රිස්තු වර්ෂ දොළොස්වන සියවසේ ඉතිහාසය හැදෑරීමට උපකාරී වන වැදගත් මූලාශ්‍රය වන්නේ,
   (1) වල්ලිපුරම් රන් සන්නස යි.
   (2) බදුලු ටැම් ලිපිය යි.
   (3) කොණ්ඩවට්ටවාන් සෙල්ලිපිය යි.
   (4) පනාකඩුව තඹ සන්නස යි.

04. අදින් වසර 125000 ක් පැරණි ඉරණමඩු සැකැස්මට අයත් ගල් යුගයට අයත් සාධක හමුවන ස්ථානය වන්නේ,
   (1) වැල්ලේගංගොඩ ය. (2) පාහියන්ගල ය. (3) පතිරාජවෙල ය. (4) වළගම්පත්තුව ය.

05. මුල් ඓතිහාසික යුගයේ මෙරට ජනාවාස ව්‍යාප්තව පැවතියේ කිනම් ප්‍රදේශවල දැයි පෙන්නුම් කරන ප්‍රධාන සාධකය කුමක් ද?
   (1) කුඩාගම් වැව් ව්‍යාප්තිය යි.
   (2) කෘෂිකර්මාන්තය වැඩි වශයෙන් සිදු වීමයි.
   (3) නිවාස වැඩි වශයෙන් ඉදිකර තිබීම යි.
   (4) නාගරීකරණය වැඩි වශයෙන් දක්නට ලැබීම යි.

06. අතීතයේ ගම්වල නායකයන් සුහදව කටයුතු කළ බවට සාධක ලැබෙන්නේ,
   (1) අනුරාධපුරයේ පෙරියන්කුලම සෙල්ලිපියෙනි.
   (2) හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිතුල්පව්වෙනි.
   (3) මාතලේ කළුදියපොකුණ සෙල්ලිපියෙනි.
   (4) කණ්ඩලම කොත්ගල්කන්ද සෙල්ලිපියෙනි.

07. සාහිත්‍ය මූලාශ්‍රය අනුව දිවයිනම එක්සේසත් කළ ප්‍රථම පාලකයා ලෙස හඳුන්වා ඇත්තේ කවුද?
   (1) විජය රජු (2) පණ්ඩුකාභය රජු (3) දුටුගැමුණු රජු (4) vi පරාක්‍රමබාහු රජු

08. I තීරුවේ සඳහන් කාර්ය හා සම්බන්ධ රජවරුන්ගේ නම් II තීරුවේ දැක්වේ. I තීරුව සමඟ II තීරුව අනුපිළිවෙලින් ගැලපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | | II තීරුව | |
|---|---|---|---|
| 1 | හේන් වගාවේදී අයකල බදු අහෝසි කිරීම | A | I උපතිස්ස |
| 2 | ප්‍රසූතිය සඳහා විශේෂිත රෝහල් කිරීම. | B | නිශ්ශංකමල්ල රජු |
| 3 | විසිවතාවක් චීනයට රාජතාන්ත්‍රික ගමන් යෙදීම | C | IV අග්ගබෝධි රජු |
| | | D | භාතිකාභය රජු |

(1) ABC (2) ACD (3) BAC (4) BCD

09. නවදැලිහේන යන යෙදුම දැකිය හැකි වන්නේ,
(1) සෙල්ලිපිවලය. (2) සද්ධර්මරත්නාවලියේ ය.
(3) උම්මග්ග ජාතකයේ ය. (4) බුත්සරණ කෘතියේ ය.

10. ක්‍රිස්තු පූර්ව 2400 ට දින නිර්ණය කර තිබෙන සොහොන් ගැබක තිබී යබොර කැබැල්ලක් සොයාගෙන ඇත්තේ,
(1) බෙරගලිනි. (2) හල්දුම්මුල්ලෙනි. (3) දෙහිඇළ කන්දෙනි. (4) සමනල වැවෙනි.

11. අතීත සෙල්ලිපිවල ''සභාව'' යන්නෙන් හඳුන්වා ඇති ආයතනය කුමක් ද?
(1) රාජ සභාව (2) ව්‍යවස්ථාදායකය (3) විධායකය (4) අධිකරණය

12. ශ්‍රී ලංකාවෙන් හමු වී ඇති විදේශීය කාසි අතරින් බහුලවම හමු වී ඇති කාසි විශේෂය වන්නේ,
(1) රෝම ය. (2) ඉන්දියානු ය. (3) චීන ය. (4) අරාබි ය.

13. ශ්‍රී ලංකාවේ දීර්ඝතම කාලයක් පැවති රාජධානිය කුමක් ද?
(1) අනුරාධපුරය (2) පොළොන්නරුව (3) මහනුවර (4) කෝට්ටේ

- **පහත A, B, C, D ප්‍රකාශ ඇසුරෙන් 14 හා 15 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - ඊජිප්තුව සමඟ වෙළඳ සබඳතා ඇතිකර ගැනීම.
B - ලංකාතිලකය හා ගඩලාදෙණි විහාර කරවීම.
C - රාජ්‍යයන් දෙකක පාලන කටයුතු මෙහෙයවීම.
D - ගම්පොල රාජධානියේ ආරම්භක පාලකයා වීම.

14. I බුවනෙකබාහු රජු සම්බන්ධයෙන් ගැලපෙන පිළිතුර කුමක් ද?
(1) A හා B ය. (2) B හා C ය. (3) A හා C ය. (4) B හා D ය.

15. IV බුවනෙකබාහු රජු සම්බන්ධයෙන්
(1) A හා B ය. (2) B හා C ය. (3) A හා C ය. (4) B හා D ය.

16. දඹදෙණි රාජධානිය පිහිට වූ තෙවන විජයබාහු වන්නි නායකයකු ලෙස කටයුතු කළ බව දැක්වෙන කෘතිය වන්නේ කුමක් ද?
(1) කව්සිළුමිණ (2) පූජාවලිය
(3) විසුද්ධි මාර්ග සන්නය (4) කඳවුරු සිරිත

17. 1521 විජයබාකොල්ලය අවස්ථාවේ මායාදුන්නේ කුමරුට සහය දුන් උඩරට පාලකයා වූයේ,
(1) වීරසුන්දර බණ්ඩාර ය. (2) කරල්ලියද්දේ බණ්ඩාර ය.
(3) යමසිංහ බණ්ඩාර ය. (4) ජයවීර බණ්ඩාර ය.

18. උඩරට රාජධානි සමයේ බෞද්ධ ප්‍රබෝධයක් ඇතිකිරීමට රජවරුන්ට අවශ්‍ය උපදෙස් ලබාදෙමින් කටයුතු කළ භික්ෂූන් වහන්සේ කවුද?
(1) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි. (2) කරතොට ධම්මාරාම හිමි.
(3) වැලිවිට සරණංකර හිමි. (4) සංඝරක්ඛිත මා හිමි.

19. පුනරුද සමයේ සාහිත්‍යමය වශයෙන් සේවයක් කළ ගත් කතුවරු අතරින් ඉතාලි ජාතිකයකු නොවන්නේ මින් කවරෙක් ද?
(1) තෝමස් මුවර් (2) ඩාන්ටේ (3) පෙට්රාක් (4) බොකැෂියෝ

- **පහත A හා B ප්‍රකාශ ඇසුරෙන් 20 ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයන්න.**

A - ගෝත්‍රික භාෂා භාවිත කිරීම. B - මානව වාදය ක්‍රියාත්මක වීම.

20. මධ්‍යකාලීන යුගය සම්බන්ධයෙන්,
(1) A හා B සත්‍ය වේ. (2) A සත්‍ය වන අතර B අසත්‍ය වේ.
(3) A හා B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

21. නූතන තාරකා විද්‍යාවේ පියා ලෙස හැඳින්වූයේ,
(1) අයිසෙක් නිව්ටන් ය. (2) ජොහැන්ස් කෙප්ලර් ය.
(3) ගැලීලියෝ ගැලීලි ය. (4) නිකලස් කොපර්නිකස් ය.

22. මුද්‍රණ කර්මාන්තය මෙරටට හඳුන්වා දෙන ලද්දේ කුමන ජාතිකයන් ද?
(1) පෘතුග්‍රීසි (2) ලන්දේසි (3) ඉංග්‍රීසි (4) ප්‍රංශ

23. පෘතුගීසීන් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අත්පත්කරගන්නා විට කෝට්ටේ පාලකයා වූයේ,
(1) හත්වන බුවනෙකබාහු ය. (2) නවවන ධර්මපරාක්‍රමබාහු ය.
(3) අටවන වීරපරාක්‍රමබාහු ය. (4) හයවෙනි පරාක්‍රමබාහු ය.

24. සීතාවක මායාදුන්නේ රජු සමඟ සන්ධානයකට පැමිණි යාපනයේ පාලකයා වූයේ කවුද?
(1) සංකිලි (2) පරරාජසේකරම් (3) විජයකුලංකෙ (4) එදිරිමානසිංහම්

25. ජෝන් කේ විසින් නිපදවන ලද නව නිෂ්පාදනය වන්නේ,
(1) මියුල් යන්ත්‍රය. (2) රෝලර් යන්ත්‍රය. (3) ජල රාමුවය. (4) දුවන නඩාවය.

26. කාර්මික විප්ලවය යුරෝපයෙන් ආරම්භ වීමට බලපෑ ප්‍රධාන හේතු වන්නේ කුමක් ද?
(1) වෙළඳාම (2) බලවත් රටවල් පැවැතීම
(3) සම්පත් බහුල බව (4) දේශපාලන නිදහස

27. 19 වන සියවස අගභාගය 20 වන සියවස මුල් දශක කීපය තුළ කාර්මික ක්ෂේත්‍රයේ අතිවිශාල ප්‍රගතියක් උදාකරගත් ආසියාතික රටවල් අතර ප්‍රමුඛ වූයේ,
(1) චීනය යි. (2) ඉන්දියාව යි. (3) ජපානය යි. (4) කොරියාව යි.

28. ශ්‍රී ලංකාවේ දුම්රිය මාර්ග ඉදිකිරීමට මූලිකත්වය ගනු ලැබූ ආණ්ඩුකාරවරයා කවුද?
(1) පෙඩ්රික් නෝර්ත් (2) එඩ්වඩ් බාන්ස් (3) රොබට් බ්‍රවුන්රිග් (4) හෙන්රි වෝඩ්

29. උඩරට රාජධානියේ අවසාන මහාධිකාරම්වරු දෙදෙනා ලෙස කටයුතු කළ අය දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) පිළිමතලව්වේ හා කැප්පිටිපොල (2) පිළිමතලව්වේ හා ඇහැලේපොල
(3) ඇහැලේපොල හා එක්නැලිගොඩ (4) එක්නැලිගොඩ හා මොල්ලිගොඩ

30. මාසික තැග්ග නම් ග්‍රන්ථය සම්පාදනය කළ සංවිධානය වන්නේ,
(1) බැප්ටිස්ට් සංගමය (2) ආගමික පුස්තිකා සංගමය
(3) චර්ච් මිෂනාරි සංවිධානය (4) ලන්ඩන් මිෂනාරි සංවිධානය

31. රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙන පිහිටුවීමට මූලිකත්වය ගත් භික්ෂූන් වහන්සේ කවුද?
(1) වලානේ සිද්ධාර්ථ හිමි (2) රත්මලානේ ධම්මාලෝක හිමි
(3) බුලත්ගම ධම්මාලංකාර සිරි සුමනතිස්ස හිමි (4) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි.

32. I තීරුවේ දැක්වෙන තොරතුරු II තීරුවේ තොරතුරු හා නිවැරදිව ගලපා යා කළ විට දැක්වෙන පිළිතුර වන්නේ,

| I තීරුව | | | II තීරුව |
|---|---|---|---|
| 1 | ලංකා සංගමය ආරම්භ කිරීම | A | පොන්නම්බලම් අරුනාචලම් |
| 2 | මුල්වරට ව්‍යවස්ථා දායක සභාවට තේරීපත් වීම | B | ජේම්ස් පීරිස් |
| 3 | ලංකා ජාතික සංගමය ප්‍රථම සභාපති | C | ජෝර්ජ් වෝල් |
| | | D | පොන්නම්බලම් රාමනාදන් |

(1) AB හා C (2) BC හා D (3) BD හා A (4) CD හා A

- **පහත සඳහන් ප්‍රකාශයන් සැලකිල්ලට ගෙන පිළිතුරු සපයන්න.**
  - ★ පාර්ලිමේන්තුව කැඳවීම හා වාර අවසාන කිරීම.
  - ★ මහ මැතිවරණයකින් පසු පැවැත්වෙන මංගල සභාවාර රැස්වීම් වල මුලසුන ගැනීම.
  - ★ ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කිරීම.

33. ඉහත දක්වා ඇත්තේ 1978 ආණ්ඩුක්‍රම වස්ථාවේ විධායක ජනාධිපතිවරයා සතු කුමන බලතල ද?
(1) ව්‍යවස්ථාදායක (2) විධායක
(3) අධිකරණ (4) රාජ්‍ය නායකයා සතු බලතල

34. පොල්ගොල්ලේදී මහවැලි ගඟ හරහා විශාල බැම්මක් තනවා සුදු ගඟට ජලය ලබාගෙන රජරට වියළි කලාපයට ජලය ගෙනයන ලද්දේ කුමන ජලාශය හරහා ද?
(1) වික්ටෝරියා (2) රන්දෙනිගල (3) බෝවතැන්න (4) ගල්ඔය

35. ක්‍රි.ව. 1492 දී කැරිබියන් මුහුදේ පිහිටි බහාමාස් දිවයින්වලට ගොඩ බසින ලද්දේ කවුද?
(1) ෆර්ඩිනන් මැගලන් (2) ක්‍රිස්ටෝපර් කොලොම්බස්
(3) වස්කෝද ගාමා (4) බර්තොලමියුඩයස්

- **පහත A, B, C හා D යටතේ ප්‍රකාශ යුගලය බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රකාශ යුගලයෙහි පළමු වැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවය පරීක්ෂා කර 36 සිට 39 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A. 1. කැපිටේෂන්
2. ප්‍රංශ විප්ලවය

B. 1. වැඩවසම් සමාජ ක්‍රමය
2. ඉඩම් අයිතිය රජු සතු වීම

C. 1. ඒකාධිපති රාජාණ්ඩු බිඳ වැටීම
2. පළමුවන ලෝක සංග්‍රාමය

D. 1. ජර්මනිය පෝලන්තයට පහර දීම
2. දෙවන ලෝක සංග්‍රාමය

36. පළමුවැන්න දෙවැන්න අතර නොගැලපීමක් ඇති පද යුගලය අයත් පිළිතුර වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

37. දෙවැන්න ඇතිවීමට බලපෑ හේතුවක් ලෙස පළමුවැන්න දැක්වෙන පිළිතුර වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

38. දෙවැන්න සිදුවීමට බලපෑ ආසන්නම සිදුවීම දැක්වෙන පිළිතුර ඇතුළත් වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

39. පළමුවැන්න දෙවැන්නෙහි ප්‍රතිඵලයක් ලෙස දැක්වෙන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

40. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ජාත්‍යන්තර අධිකරණය පිහිටා ඇත්තේ කොහේ ද?
(1) නෙදර්ලන්තයේ හේග් නුවර (2) ඇමෙරිකා එක්සත් ජනපදයේ නිව්යෝර්ක්
(3) එංගලන්තයේ ලන්ඩන් (4) රුසියාවේ මොස්කව්

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 2025
Third Term Test - 2025

33 S II

11 ශ්‍රේණිය

# ඉතිහාසය - II

කාලය පැය 03 යි.
අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.

නම/ විභාග අංකය:

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න 4 ක් ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.
- අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි.
  (අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

---

## I - කොටස

(01) (අ) (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.

මල්වතු ඔය, කිරිඳි ඔය, මාදුරු ඔය ජලාශය, නාච්චදූව වැව, දේවනගර, ගම්පොල, සීගිරිය, ලුණුවිල, පොම්පරිප්පු, කෝනේෂ්වරම්, පඬුවස්නුවර, යාපනය (ලකුණු 12)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.

බොම්බාය, කළුමුහුද, ජිනෝවා, සුමාත්‍රා දූපත, ස්පාඤ්ඤය, ලන්ඩන්

(ලකුණු 06)

(ආ) (i) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A පනාකඩුව තඹ සන්නස කරවූ රජතුමා.

B අතීතයේ දී උණ රෝගීන් සඳහා විශේෂයෙන් ඉදිකළ රෝහල් විශේෂය හඳුන්වන නම.

C පියෙටා ප්‍රතිමාව නිර්මාණය කළ මූර්ති ශිල්පියා.

D පළමුවන ලෝක සංග්‍රාමය සමයේ ජර්මනිය විසින් පහර දුන් ඇමෙරිකානු නැව.

(ලකුණු 04 යි)

- **A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.**

(ii) (1) A පින්තූරයෙන් දැක්වෙන නිර්මාණය හමුවන්නේ කිනම් ස්ථානයකින් ද?

(2) මෙහි ඇති පබළු ආනයනය කරන ලදැයි සැලකෙන රට කුමක් ද?

(3) මෙය හමුවී ඇති කාලවකවානුව කුමක් ද?

(4) මෙමගින් පිළිබිඹු වන කරුණ කුමක් ද?



A

(ලකුණු 04 යි)

(iii) (1) B රූපයෙන් දැක්වෙන පුද්ගලයා කවුද?

(2) ඔහු විසින් ලෝකයට හඳුන්වාදෙන ලද්දේ කුමක් ද?

(3) එය කුමන ක්ෂේත්‍රයක් හා සම්බන්ද නිර්මාණයක් ද?

(4) එය ක්‍රියාත්මක වන්නේ කුමන බලයක් ආධාරයෙන් ද?



B

(ලකුණු 04 යි)

## II - කොටස

(02) (i) ප්‍රාග් ඓතිහාසික මානවයින් භාවිතය ට ගනු ලැබූ පාෂාණ වර්ග තුනක් දක්වන්න.

(ලකුණු 03 යි)

(ii) ප්‍රාග් ඓතිහාසික යුගයෙන් පූර්ණ ඓතිහාසික යුගය වෙන්ව හඳුනාගැනීමට උඩරංචාමඩමෙන් හඳුනාගත හැකි සාධක දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ මානයින් අනුගමනය කළ ක්‍රමවත් සුසාන විධි දෙකක් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ක්‍රමවත්ව සිදු වූ බව කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(03) (i) පිය උරුමයෙන් රාජ්‍යත්වය හිමිකර ගනු ලැබූ අනුරාධපුර යුගයේ රජවරුන් තිදෙනෙකු ලියා දක්වන්න. (ලකුණු 03 යි)

(ii) රජුගෙන් රටවැසියාට ඉටුවිය යුතු යුතුකම් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) වසභ රාජ්‍ය සමයේ වැදගත්කම කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) අතීත ශ්‍රී ලාංකිකයන් වාර්ගික සහජීවනයෙන් යුක්තව කටයුතු කළ බව කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(04) (i) අතීතයේ දී අවකාශය මැනීම සඳහා භාවිත කළ මිණුම් වර්ග තුනක් නම් කරන්න.

(ලකුණු 03 යි)

(ii) අනුරාධපුර යුගයේ රෝහල් ඉදිකිරීමට කටයුතු කළ රජවරු හතර දෙනෙකු ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) අතීතයේ ජලකළමනාකරණයේ දී උසස් තාක්ෂණයක් අනුගමනය කළ බව කරුණු දෙකක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) අතීත ජන සමාජ යහපත්ව පවත්වාගෙන යාමට ක්‍රියාවට නංවන ලද නීති හා සම්ප්‍රදායන් තුනක් දක්වා ඒ පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(05) (i) මහනුවර රාජධානිය පාලනය කළ නායක්කර් වංශික රජවරු තිදෙනෙකු ලියා දක්වන්න. (ලකුණු 03 යි)

(ii) මහනුවර රාජධානියේ පරිපාලන කටයුතු බෙදා තිබුණ ප්‍රධාන අංශ හතර ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) උඩරට රාජධානියේ සමාජ සංවිධානයේ දක්නට ලැබුණ අංශ දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) පළමු වන විමලධර්මසූරිය රජුගේ වැදගත්කම කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06 යි)

(06) (i) ප්‍රංශ ජාතිකයන් ඉන්දියාවේ පිහිට වූ වෙළඳ මධ්‍යස්ථාන තුන නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වන අවධියේ පෙත්සම් මගින් ශ්‍රී ලාංකිකයන් ඉල්ලා සිටි ප්‍රධාන ඉල්ලීම් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) ඉංග්‍රීසි පාලනය නිසා මෙරට ඇතිවූ සමාජීය වෙනස්කම් දෙකක් දක්වා ඒ පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මෙරටට හඳුන්වා දෙනු ලැබූ නව අංගයන් තුනක් පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(07) (i) ඉංග්‍රීසීන් අනුගමනය කළ වතු වගා ව්‍යාපාරය යටතේ අපනයන බෝගයන් ලෙස සාර්ථක නොවූ වගාවන් තුනක් නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) මෙරට කෝපි වගාව දියුණු වීමට බලපෑ හේතු හතරක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) නිදහසින් පසු මෙරට සමාජ සුභසාධනයට ගත් පියවරයන් දෙකක් දක්වා ඒ පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) නිදහසින් පසු මෙරට වී ගොවිතැන දියුණු කිරීමට ගන්නා ලද ක්‍රියාමාර්ග තුනක් පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## III කොටස

(08) (i) බ්‍රිතාන්‍යයන් විසින් ඇමෙරිකාවේ පිහිට වූ ජනපද තුනක් ලියා දක්වන්න. (ලකුණු 03 යි)

(ii) බ්‍රිතාන්‍යයන් විසින් ඇමෙරිකාව ආනයන කළ භාණ්ඩ කිහිපයකට තීරුගාස්තු නියම කළ අතර එම භාණ්ඩ හතරක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) ප්‍රංශ විප්ලවයට බලපෑ දේශපාලන හේතු දෙකක් දක්වා ඒ පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) රුසියන් විප්ලවයේ ප්‍රතිඵල තුනක් පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(09) (i) දෙවන ලෝක සංග්‍රාමයට සම්බන්ධ වූ අක්ෂ පක්ෂයට අයත් රටවල් තුන නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) වර්සෙල්ස් ගිවිසුමෙන් ජර්මනියට පැනවූ දඬුවම් දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) පළමු වන ලෝක සංග්‍රාමය ඇතිවීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) දෙවන ලෝක සංග්‍රාමයේ ප්‍රතිඵල තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(01) (ඇ) (i)
(01) (*a*) (i)
(01) (*அ*) (i)



(01) (ඇ) (ii)
(01) (*a*) (ii)
(01) (*அ*) (ii)



## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(2) | 3 -(4) | 4 -(3) | 5 -(1) | 6 -(2) | 7 -(3) | 8 -(3) | 9 -(2) | 10 -(1) |
| 11 -(4) | 12 -(1) | 13 -(1) | 14 -(3) | 15 -(4) | 16 -(2) | 17 -(4) | 18 -(3) | 19 -(1) | 20 -(2) |
| 21 -(4) | 22 -(2) | 23 -(3) | 24 -(1) | 25 -(4) | 26 -(1) | 27 -(3) | 28 -(4) | 29 -(2) | 30 -(3) |
| 31 -(1) | 32 -(4) | 33 -(1) | 34 -(3) | 35 -(2) | 36 -(2) | 37 -(1) | 38 -(4) | 39 -(3) | 40 -(1) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (අ) නිවැරදිව සිතියම් වල සලකුණු කොට ඇතිනම් ලකුණු ලබාදෙන්න.

(ආ) (i) A - I විජයබාහු රජතුමා B - උපසග්ගරෝගනාස
C - මයිකල් ආන්ජලෝ D - ලුසිටානියා

(ii) (1) ඉබ්බන්කටුව සුසාන භූමියෙන් (2) ඉන්දියාව
(3) ක්‍රිස්තු පූර්ව 700 - 450
(4) වර්ධනය වන ප්‍රභූන්ගේ ජීවිතයේ සුඛිත මුදිත ස්වරූපය

(iii) (1) ජෝර්ජ් ස්ටීවන්සන් (2) දුම්රිය එන්ජිම
(3) ප්‍රවාහන (4) වාෂ්ප බලයෙන්

## II කොටස

(02) (i) තිරිවානා, කහද, කළුගල්

(ii)
- පිලිස්සූ මැටි වළං භාවිතය,
- ස්ථිරවාසිතාව
- යකඩ මෙවලම් භාවිතය (මෙම කරුණු 03 න් දෙකක්)

(iii) ශිලා මංජුසා සොහොන් - විශාල ගල්පතුරු එක්තැන්කොට චතුරස්‍රාකාර හැඩයකට සකසා එහි ඇතුලත මිනිස් භෂ්මාවශේෂ සහිත මැටි බඳුන් තැන්පත් කර ගල් පුවරුවකින් ආවරණය කර තිබීම. හමුවූ ස්ථාන වලට උදාහරණ ලෙස දඹුල්ලට නුදුරු ඉබ්බන්කටුව, යාපහුවේ ගල් සොහොන් කනත්ත, ගලේවෙලට නුදුරු යටිගල පොත්ත දැක්විය හැකිය.

මැටිඔරු සුසාන - මැටියෙන් සකසන ලද ඔරුවක හැඩැති බේසමක භෂ්මාවශේෂ බහා ලූ මැටි වලං තැම්පත් කිරීම. භෂ්මාවශේෂ තැන්පත් කරන්නට පෙර මෙම මැටිඔරු තුළ මිනිස් ඇටසැකිලි ආදාහනය කර තිබේ. උදාහරණ : බෙරගල හා හල්දුම්මුල්ල

භාරණි සුසාන - භෂ්මාශේෂ සහිත මැටි බඳුන් විශාල මැටි බඳුනක් තුළ තැන්පත් කිරීම මෙහිදී සිදුවී ඇත. උදාහරණ : පොම්පරිප්පු (මෙම ක්‍රම 03 අතරින් 02 ක් පිළිබඳ විස්තර)

(iv)
- වෘත්තීන් අනුව කාර්යන් අනුව වෙන් කර තිබීම. උදාහරණ දක්වමින් පැහැදිලි කල යුතුය. උදා.: කදිකාරගාම - ගොවියන් විසූ ගම්, වඩ්ඩකිගාම - වඩුවන් විසූ ගම්....... එලෙස අනෙක් ගම්ද නම් කර විස්තර ලිවිය යුතුය.
- ගම්වල පරිපාලනය ක්‍රමවත්ව සිදුවීම, ගෘහපති, ගමික, දසගම් ඇත්තන් පිළිබඳ තොරතුරු දැක්විය යුතුය. මෙහිදී පරුමක ගැන විස්තර සඳහන් කරන්නේ නම් එම කරුණු වැරදිය. හේතුව පරුමක වරු ගම් කිහිපයක් එක්වූ ප්‍රදේශයක පාලන කටයුතු මෙහෙයවන පුද්ගලයා නිසා.
- ගම් වෙන්කොට ආරක්‍ෂා කර ගැනීමට කටයුතු කිරීම. : එලෙස වැටකින් ආරක්ෂා කර තිබූ ගම් පරික්ඛිත්ත ගාම ලෙස හඳුන්වන ලද බවත්, ඇතැම් ගම් එලෙස නොවූ බවත් දැක්විය යුතුය. එමෙන්ම එම ගම් වලට අමතරව මෙම කාලය තුළ විශාල නාගරික ජනාවාස තිබූ බවත් ඒවා පුර යන නමින් හැඳින්වූ බවද ඒවායේ වාස්තු ශිල්පී නිලධාරියෙක් පිළිබඳ ව සෙල්ලිපිවල දක්වා ඇති අතර එම තනතුර පුර කමත නමින් හඳුන්වා ඇත.

(03) (i) මුටසීව, දේවානම්පියතිස්ස, වංකනාතිකතිස්ස, දුටුගැමුණු

(ii)
- රට ආර්ථික වශයෙන් දියුණු කිරීම.
- රටවැසියාට ආරක්ෂාව සැපයීම.
- රටවැසියාගේ අධ්‍යාත්මික සංවර්ධනය ගොඩනැගීම.
- රටවැසියාට සෞඛ්‍ය වැනි සුභසාධන සේවාවක් ලබාදීම.

(iii)
- මහවැව් තැනීම මඟින් දේශීය මෙන්ම විදේශීය වශයෙන් ආර්ථිකය නඟා සිටුවීමට දායක වීම.
- මහවැව් තැනීම ආරම්භ කිරීමට බල පෑ හේතුව දක්වා ඉදිකල වැව් හා ඇල මාර්ග ප්‍රමාණය උදාහරණ දක්වමින් පැහැදිලි කළ යුතුය.
- පරිපාලනය ක්‍රමවත්ව හා සංවිධානාත්මකව කිරීම. වර්තමාන දිස්ත්‍රික්ක වලට සමාන ආස්ථාන බෙදා ඒවායේ පරිපාලනයට ඇමතිවරුන් පත්කිරීම. ඔවුන්ට ස්වාධීනව කටයුතු කිරීමට අවස්ථාව හිමිවීම. උදා.: වසභ රජුගේ වල්ලිපුරම් රන් සන්නසට අනුව යාපනයේ ඉසිගිරි ඇමතියා පියංගුකතිස්ස නමින් විහාරයක්ද ඉදිකරමින් පාලනය ගෙනයාම.
- වෙහෙර විහාර විශාල ප්‍රමාණයක් ප්‍රතිසංස්කරණය කිරීම. (මින් දෙකක් විස්තර කිරීම 05)

(iv)
- මෙරටට විදේශ රටවලින් විශාල ලෙස වෙළඳ කණ්ඩායම් පැමිණි අතර ඔවුන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම. උදාහරණ දක්වමින් පැහැදිලි කළ යුතුය.
- රජවරුන්ද විදේශ වලින් පැමිණි ජන කණ්ඩායම් වලට දැක්වූ අනුග්‍රහය. උදා.: රාජසභාවේ දෙමළ අධිකාරි නමින් තනතුරක් ඇතිකොට එම ජන කණ්ඩායම් පිළිබඳ සොයා බැලීම.
- සාමාන්‍ය ජනයා සයෝගයෙන් කටයුතු කිරීම. උදා.: අම්පාර දිස්ත්‍රික්කයෙන් දෙමළ ජාතිකයකු සමඟ විවාහ වූ සිංහල කාන්තාවක් පිළිබඳ තොරතුරු හමුවීම. අභයගිරියෙන් ශාසනයේ පැවිදි වූ දෙමළ ජාතික භික්ෂුවක් ගැන සඳහන්වීම. මුස්ලිම් ජාතිකයන් ආදම්ගේ කන්ද නමින් හඳුන්වා ශ්‍රී පාදය වන්දනාමාන කිරීම.

(04) (i) කිරිය, අමුණ, කරිසය, පැල, ලාහ, කුරුණි (මේවායින් 03 ක්)

(ii) බුද්ධදාස රජු, හතරවන කාශ්‍යප රජු, පළමුවන උපතිස්ස රජු, පණ්ඩුකාභය රජු, දුටුගැමුණු රජු

(iii)
- මහවැව් ඉදිකිරීමේදී වැවෙහි අංග පිළිබඳ දක්වමින් පැහැදිලි කළ යුතුය. වැව් බැම්ම, බිසෝකොටුව, සොරොව්ව, රළපනාව
- ඇල මාර්ග ඉදිකිරීම, ඇලහැර ඇල, යෝධ ඇල ආදි ඇළමාර්ග උදාහරණයට ගෙන පැහැදිලි කළ යුතුය.

(iv)
- කෘෂිකාර්මික කටයුතු වලදී පනවන ලද නීති, උදාහරණ දක්වමින් පැහැදිලි කළ යුතුය.
- වෙළඳාමේදී නීතිරීති පැනවීම. වෙළඳාමේදී සිදුවන අකටයුතු යම් වැලැක්වීමට බදුලු ටැම් ලිපිය මගින් පැනවූ නීති දක්වමින් පැහැදිලි කළ යුතුය.
- සතුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් පනවන ලද නීතිය. උදා.: අමණ්ඩ ගාමිණී අභය රජු ...... නීතිය පැනවීම, හතරවන මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපියේ මී හරකුන්, එළහරකුන් සහ එළුවන් ඝාතනයට මරණ දඬුවම පැනවීම ආදිය.

(05) (i) • ශ්‍රී විජයරාජසිංහ රජු • කීර්ති ශ්‍රී රාජසිංහ රජු • රාජාධිරාජසිංහ රජු • ශ්‍රී වික්‍රමරාජසිංහ රජු (මින් තුන්දෙනෙක්)

(ii) මහවාසල , රටවසම (ප්‍රදේශීය පාලන සංවිධානය) මහබද්ද ( බද්දේ සංවිධානය) විහාර දේවාලගම් පාලනය

(iii)
- රටේ සියලු ඉඩම්වල උරුමකරුවා වූ රජු ඉඩම් භුක්තිය පදනම් කරගෙන කොටස් කිහිපයකට බෙදා දීම. උදාහරණ දක්වමින් පැහැදිලි කළ යුතුය.
- සාමාන්‍ය ජන ජීවිතයේ ස්වභාවය පවුල ප්‍රධාන සමාජ ඒකකය වූ බවත් පීතෘ මූලික සමාජ ක්‍රමයක් පැවතීම. රැකියාව හා විවාහය කුලක්‍රමය මත තීරණය වීම. විවාහ ක්‍රම 03 ක් පැවතීම පිළිබඳ විස්තර.

(iv)
- උඩරට පෘතුගීසි ග්‍රහණයෙන් මුදවා ගැනීම. දන්තුරේ සටන හා බලන සටන පිළිබඳ තොරතුරු දක්වමින් පැහැදිලි කිරීම.
- බුදු දහම නඟා සිටුවීමට ක්‍රියා කිරීම. දළදා වහන්සේ වෙනුවෙන් ස්ථිරව දළදා මාලිගාව ඉදිකිරීම. බුරුම දේශයෙන් උපසම්පදාව ගෙන ඒම හා පැරණි වෙහෙර විහාර අලුත් වැඩියාවට කටයුතු කිරීම. උදා.: ලංකාතිලක, රිදී විහාරය, දෙගල් දොරුව
- ආර්ථිකය දියුණු කිරීමට කටයුතු කිරීම. ගොවිතැන දියුණු කිරීමට කටයුතු කිරීම. ඒ යටතේ කපු වගාව දියුණු කිරීමට අනුබල දීම. කොත්මලේ, වලපනේ ප්‍රදේශවල යකඩ හා වානේ කර්මාන්තය දියුණු කිරීම හා උඩරට රාජ්‍ය ආශ්‍රිතව මෙහි ලුණු කර්මාන්තයේ දියුණුවට පියවර ගැනීම.

(06) (i) • පොන්ඩිචෙරි • කරිකාල් • චන්දනගර්

(ii)
- ව්‍යවස්ථාදායක සභාවේ නිල නොලත් සාමාජික පිරිස ඉහළ දැමීම.
- වාර්ගික නියෝජනය අහෝසි කිරීම.
- පළාත්බද නියෝජන ක්‍රමය හඳුන්වා දීම.
- ව්‍යවස්ථාදායක සභාවේ බලතල වැඩිකිරීම.

(iii) මධ්‍යම පන්තියක් බිහිවීම. මෙරට ඇතිවූ වතුවගා ව්‍යාපාරය නිසා මෙරට ජනතාවටද මුදල් උපයා ගැනීමේ මාර්ග විවාර වීම. මිනිරන් කර්මාන්තය, ප්‍රවාහනය, වෙළඳාම, අරක්කු රේන්ද ආදියෙන් එම පිරිස් ඔවුන්ගේ දූ දරුවන් විදේශ රටවලට යවා අධ්‍යාපන අවස්ථා ලබාදීම, ඔවුන් ධනවත් මෙන්ම උගත් පිරිසක් වූ අතර ඔවුන් මධ්‍යම පංතිය ලෙස හැඳින්වේ.

කම්කරු පංතියක් බිහිවීම :- මෙරට ඇතිවූ වතුවගා ව්‍යාපාරය නිසා විදේශීය ආයෝජකයන් විශාල පිරිසක් මෙරට පැමිණි අතර ඔවුන් නිසා මෙරට නාගරික කම්කරු පංතියක් බිහිවිය. රෙදි සෝදන්නන්, කරත්ත කරුවන් ආදී ලෙස වතු වගාවන් සඳහා දකුණු ඉන්දියාවෙන් ද මෙරටින් ද ශ්‍රමිකයන් සම්බන්ධ කරගත් අතර ඒ අනුව වතු කම්කරු පිරිසක් බිහිවීම.

(iv) ජාතික රාජ්‍ය සභාව :- සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ක්‍රියාත්මක වූ පාර්ලිමේන්තුව නමින් හැඳින්වූ ව්‍යවස්ථාදායක සභාව ජාතික රාජ්‍ය සභාව ලෙස නම් කෙරිනි. මහජන ඡන්දයෙන් පත්වූ නියෝජිතයන්ගෙන් සමන්විත වූ මෙය ශ්‍රී ලංකාව සඳහා නීති සම්පාදනය සිදුකළ අතර නිල කාලය වසර 06 කි.

- මූලික මිනිස් අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කිරීම. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18 වෙනි වගන්තියෙන් මූලික මිනිස් අයිතිවාසිකම් හා නත් වැදැරුම් නිදහස ගැන සඳහන් වේ. එහි සඳහන් මූලික මිනිස් අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

ජනාධිපති තනතුර : සෝල්බරි ව්‍යවස්ථාව යටතේ ක්‍රියාත්මක වූ අග්‍රාණ්ඩුකාර තනතුර වෙනුවට නාමික විධායක ජනාධිපති ධූරය හඳුන්වා දීම. අගමැතිවරයා විසින් පත් කිරීම. ප්‍රථම නාමික විධායක ජනාධිපති ලෙස එවකට අග්‍රාණ්ඩුකාරධූරය දැරූ විලියම් ගොපල්ලව මහතා පත්වීම.

(07) (i) • සිංකෝනා • කොකෝවා • පොල්

(ii)
- විදේශිකයන් වැඩි වශයෙන් කෝපි වගාවට ධනය ආයෝජනය.
- යුරෝපා වෙළඳපලේ කෝපි වලට ඇති ඉල්ලුම ඉහළ යාම.
- කෝපි වගාවෙන් විශාල වශයෙන් ලාභ ලැබිය හැකි වීම.
- ඉන්දියානු ශ්‍රමිකයින් ලාභදායිව ගෙන්වා ගැනීමට හැකිවීම.
- කෝපිවලට අයකල අපනයන බද්ධ අඩුකිරීම. යන කරුණු අතරින් 04 ක්

(iii) සෞඛ්‍ය නඟා සිටුවීමට කටයුතු කිරීම.

නිදහසට පෙර නාගරික ප්‍රදේශ වලට සීමා වී තිබූ සෞඛ්‍ය සේවා ග්‍රාමීය ප්‍රදේශ වල වැඩි දියුණු කිරීම. උදා.: ග්‍රාමීය රෝහල් පිහිටුවීම, සායන පැවැත්වීම.

පොදු පහසුකම් නඟා සිටුවීමට කටයුතු කිරීම.

ඒ අනුව ප්‍රවාහනය, ජලය, විදුලිය, පණිවිඩ හුවමාරුව වැනි සේවාවන් පෙර මෙන්ම ග්‍රාමීය ප්‍රදේශ දක්වා ව්‍යාප්ත කිරීම.

ආහාර සහනාධාර ක්‍රමයක් ක්‍රියාවට නැංවීම

ලෝක සංග්‍රාම සමයේ නාමික ගමනා ගමනයට පැවති බාධා හේතුවෙන් රජය මැදිහත් වී ආහාර සහනාධාර ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම. නිදහසින් පසුව විවිධ ක්‍රම මගින් එම වැඩපිළිවෙල අඛණ්ඩව ක්‍රියාත්මක කළ ආකාරය දැක්විය යුතුය.

(iv) ගොවිජනපද පිහිටුවීම :

නිදහසට පෙර හා නිදහසින් පසු ලංකාවේ වී ගොවිතැන වඩාත් හොඳින් ක්‍රියාත්මක කළ හැකි ස්ථාන වල ගොවි ජනපද පිහිටුවීම. රටේ ආහාර නිෂ්පාදනය ඉහළ දැමීම ප්‍රධාන කොටගෙන ආරම්භ කරන ලද ගොවිජනපදවලට ආරම්භයේ විවිධ පහසුකම් සපයා දෙමින් පවත්වාගෙන යාම.

මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය ඇරඹීම :

කෘෂිකර්මාන්තයට අවශ්‍ය නිත්‍ය ජල පහසුකම් සැපයීමේ අරමුණින් මහවැලි ගඟ මූලික කර ගනිමින් මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ ජලාශ ආරම්භ කිරීම පිළිබඳ විස්තර දැක්විය යුතුය.

වෙනත් ක්‍රියාමාර්ග මඟින් වී ගොවිතැනට අවශ්‍ය සහය ලබා දීම.

වී සඳහා සහතික මිලක් හඳුන්වා දීම, වී පර්යේෂණ ආයතන පිහිටුවීම හා නව වී ප්‍රභේද හඳුන්වාදීම ආදිය.

## III කොටස

(08) (i) ජනපද 13 අතරින් ඕනෑම 03 ක් ලියා ඇත්නම් ලකුණු පිරිනමන්න.

(ii) වීදුරු, ඊයම්, කඩදාසි, තේ

(iii) පාලනයේ පැවති ඒකාධිපති හා දූෂිත බව

ස්ටේට් ජනරල් සභාව වසර 175 කින් රැස්කර නොතිබීම. ඉන්ටෙන්ඩාන්ට් නම් ප්‍රාදේශීය පාලනයද අකාර්යක්ෂම වීම, රජවරු ඒකාධිපතියන් ලෙස කටයුතු කිරීම, 14 වෙනි ලුවී රජුගේ ප්‍රකාශ වන රාජ්‍ය නම් ''මමය මා අපේක්ෂා කරන ඕනෑම දෙයක් නීත්‍යානුකූලය වන ප්‍රකාශ වලින් පැහැදිලි වීම.

රජවරුන් ගත කල අධි සුඛෝපභෝගී ජීවිතය ඃ

වර්සෙල්ස් මාලිගාවේ වාසය කිරීම. එහි ඇති සැප පහසුකම් හා රජු හා සාමාන්‍ය ජනතාව අතර දුරස් බව සාමාන්‍ය ජනතාව ඉතා දුක්ඛිත ජීවිත ගතකිරීම. ඒවා රජවරුන්ට නොදැනීම. උදා.ඃ මාරි ඇන්ටනොයිට් පාන් නැත්නම් කේක් කාපල්ලා යන ප්‍රකාශය ආදිය.

ජනතාව වෙත එල්ල වූ දැඩි පීඩනය

කිසිදු වග විභාගයකින් තොරන බැස්ටිල් සිරභාරයට දැමීම. එම රජුට අයත් බලතල දේශපාලන සතුරන් මැඩීමට යොදා ගැනීම.

(iv) කෙරෙන්සකිගේ නායකත්වයෙන් යුත් රජය පෙරලා දමා ලෙනින්ගේ නායකත්වයෙන් යුත් බොල්ෂෙවික්වරුන් රජයක් පිහිටුවීම. එම රජය ජර්මනිය සමඟ පැවති යුද්ධය අවසන් කොට රටට සාමය උදාකිරීම මගින් සොල්දාදුවන්ගේ බලාපොරොත්තු ඉටුවිය.

පෞද්ගලික අයිතීන් අහෝසි කිරීම.

ලෙනින්ගේ නායකත්වයෙන් යුතු නව ආණ්ඩුව පෞද්ගලි ඉඩම් අයිතිය අහෝසි කර රජයට ඉඩම් පවරාගන්නා ලදී. එම ඉඩම් මුලදී ගොවීන්ට කුඩා ගොවිපලවල් ලෙස පවත්වා ගැනීමට ඉඩ හැරියද පසුව ඒවා සමූහ ගොවිපලවල් බවට පත් කිරීම කර්මාන්තශාලා ජනසතු කිරීම. එහි පාලනය සෝවියට් මණ්ඩල වලට පැවරීම.

සමාජවාදී දර්ශනය ලොව පුරා ව්‍යාප්ත වීම.

පුද්ගල අවශ්‍යතා වලට වඩා පොදු දියුණුවට පොදු අවශ්‍යතා වලට ප්‍රමුඛත්වය දීම, සමාජ අසාධාරණකම් හා අසමාන තා නැතිකිරීම, සමාජයේ පංති විෂමතා නැතිකර සියලු දෙනාට සහෝදරත්වයෙන් සලකන උසස් මානව සමාජයක් ගොඩනැගීම, පරමාර්ථ කරගනිමින් සමාජවාදී දර්ශනය බිහිවූ අතර එය නැගෙනහිර ජර්මනිය, චීනය, කියුබාව වැනි රටවල් කිහිපයක ව්‍යාප්ත විය.

(09) (i) ජර්මනිය, ඉතාලිය, ජපානය

(ii)
- ජයග්‍රාහී රටවලට විශාල වන්දි මුදලක් ගෙවීමට ජර්මනියට සිදුවීම.
- හමුදා තබාගැනීම හා අවි ආයුධ නිෂ්පාදනය සඳහා ජර්මනියට සීමා පැමිණවීම.
- ජර්මනිය ප්‍රංශයෙන් අල්ලා ගෙන තිබූ ඇල්සස් ලෙරේන් ප්‍රදේශ යලි ප්‍රංශයට පවරා දීම.
- යුරෝපයෙන් පිටත ජර්මනිය සතු වූ යටත් විජිත ජයග්‍රාහී ජාතීන් අතර බෙදාදීම.

(iii)
- ආසන්නම හේතුව ඕස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරා සරයේවෝ ප්‍රදේශයේදී ඝාතනයට ලක්වීම.
- ජර්මනිය එක්සත් කිරීමේ ව්‍යාපාරයේදී ප්‍රංශය සතුරන් බවට පත්වීම.
- ජර්මන් අධිරාජයා වූ දෙවන විලියම්ගේ ක්‍රියා කලාපය.
- යටත්විජිත සඳහා වූ තරගය
- අවි තරගය හා ජාතිවාදය වර්ධනය වීම යන කරුණු වලින් දෙකක් විස්තර කිරීම. (11 ශ්‍රේණිය පෙළපොතේ 133, 135 පිටු)

(iv)
- විශාල මිනිස් ජීවිත හා දේපල ප්‍රමාණයක් විනාශ වීම

  හිට්ලර්ගේ යුදෙව්වන් ඝාතනය කිරීමේ වැඩපිළිවෙල අනුව ජර්මනිය, පෝලන්තය, හංගේරියාව වැනි රටවල යුදෙව්වන් මිලියන ගණනක් වද කඳවුරු වලට ගාල්කර මරා දැමීම. ජපානයට ඇමරිකාව විසින් එල්ල කරන ලද බෝම්බ ප්‍රහාර නිසා විශාල ජීවිත දේපල විනාශ වීම ආදිය.

- ලෝක බලවතුන් ලෙස ඇමෙරිකාව හා රුසියාව නැගී සිටීම.

  ලෝකයේ බල කඳවුරු දෙකක් පිහිටුවාගෙන ක්‍රියාත්මක වීම පිළිබඳ විස්තර දැක්විය යුතුය. (පෙළපොත පිටුව 152, 153)

- එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීම ඃ

  දෙවන ලෝක සංග්‍රාමය පවතින අතරතුරම බ්‍රිතාන්‍ය අගමැතිනි විනිස්ටන් චර්චිල් හා ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට් අත්සන් කළ අත්ලාන්තික් ප්‍රඥප්තිය සමඟ ප්‍රබල රටවල් 05 නායකයන් මොස්කව් නුවර පැවැත්වූ සාකච්ඡා වලින් පසුව ඇමෙරිකාව, බ්‍රිතාන්‍ය, රුසියාව යන රටවල නායකයන් ටෙහෙරාන් නුවරට එක්ව කල සාකච්ඡා වල ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය ආරම්භ වීම. ආදී එම සංවිධානයට ආයතන ආදිය දැක්විය යුතුය.